# උංගා



ඩී.ජී. සවෙත්මි සිතුම්සා නයනදිනි ගුණසේකර

# උංගා

ඩී.ජී. සවෙත්මි සිතුමිසා නයනදිනි ගුණසේකර

උංගා

ඩී.ජී. සවෙත්මි සිතුමිසා නයනදිනි ගුණසේකර
මහාමායා බාලිකා විදුහල
මහනුවර

ISBN - 978-624-208-457 -2

මුද්‍රණය

කතෘගේ වෙනත් කෘති

1. හා පැංචාගෙන් අපූරු පාඩමක්
   ISBN - 978-624-206-732 -2

2. රතු මල

   ISBN - 978-624-208-460 -2

# පිදුම

මා ඉගෙනුම ලබන

මහාමායා බාලිකා විදුහලේ

විදුහල්තිතුමිය ඇතුළු

ගුරු මෑණිවරුන් සහ

ගුරුපියවරුන් ඇතුළු

මාගේ පංති භාර ගුරුතුමිය සහ

මාගේ මිතුරියන් හට සහ

මාගේ දෙමාපියන් දෙපලට

මාගේ නැගනියට

මේ පොත් පිංච

ආදරයෙන් පුදමි.

# පෙරවදන

සාහිත්‍ය දියුණුව රටක සංවර්ධනය මනින මිණුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ දඹදෙණි යුග කැපී පෙනෙන්නේ ද සාහිත්‍ය වශයෙන් ප්‍රබෝධමත් කාල පරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහහිත්‍ය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කර ගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සී මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථ කරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇති කරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේ ම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵළයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නොඅනුමානය.

.

විදුහල්පතිනිය<br>
ශශිකලා සේනාධීර<br>
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.


අද මට ගොඩක් සතුටුයි. මට අද අම්මයි තාත්තයි ලස්සන තෑග්ගක් දුන්නා.



අනේ එයා ගොඩක් ලස්සනයි. වේලාවකට එකපාරට මට හිනා වෙනවා. වෙලාවකට එක පාරටම හයියෙන් අඬනවා.



උංගා නිතරම ඉන්නේ අම්මා ළඟ. එයාට උංගා කියලා නම දැම්මෙත් මම. මොකද එයා අඬන්නේ උංගා උංගා කියලා.



උංගා හරිම හුරතල්. දැන් උංගා ටිකක් ලොකුයි. උංගා දැන් මාව හොඳටම අඳුරනවා. මාව දැක්කම හයියෙන් හිනා වෙලා මාව පිළිගන්නවා.



දින, සති, මාස ගෙවිලා ගියා.
අම්මයි, මමයි, තාත්තයි උංගව
එක්කන් ඉස්සෙල්ලාම දළදා
මාලිගාව වඳින්න ගියා. අද මට
හරිම සතුටුයි.


මගේ චූටි උංගා දැන් ලොකුයි.

මම පාසල් ගිහින් ඉක්මණට ගෙදර යන්න කැමතියි. මොකද මගේ උංගා මම එනකන් ආසාවෙන් බලන් ඉන්නේ.



මම උංගත් එක්ක සෙල්ලම් කරනවා. ලස්සන කතන්දර කියලා දෙනවා.

උංගා ඒවට හරිම කැමතියි.



මගේ උංගා දැන් ගොඩක් ලොකුයි.
දැන් එයා කෑම කනවා. දණ ගගා
මුළු ගෙදර ඇවිදිනවා.
මම උංගව ආදරයෙන්
බලාගන්නවා.



මට කියන්න බැරි වුණානේ උංගා
කියන්නේ මගේ නංගිට
මගේ නංගි හරිම ලස්සනයි.
ගොඩක් හුරතල්.

මට අම්මගෙන්, තාත්තගෙන්
ලැබුණු තෑග්ග තමයි මගේ නංගි
(උංගා) මම මගේ උංගාට ගොඩක්
ආදරෙයි. එයාගේ ඇත්ත නම
මිතාෂා.

ඒ නම දැම්මෙත් මම.



# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍ය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණය කරන විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩනැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියා මූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩ පාසල්, කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරු භවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්ණ නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මකව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණ යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්‍ෂණය සමඟ ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමඟ එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙන යාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ. තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්